# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 8,616—1940ක්වූ මැයි මස 24 වෙනි දිනවූ සිකුරාද.

## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### උපාඛ්‍යා නීති.

M. L. A.—B 1768
L. D.—B 140/29

**බල්ලන් ලියාපදිංචිකිරීමේ ආඥාපනත.**

කළුතර නාගරික සභා සීමාවතුල බල්ලන් ලියාපදිංචිකිරීමේ ආඥාපනතේ (334 වැනි පරිච්ඡේදය) 4 වැනි වගන්තිය යටතේ අතුරු ව්‍යවස්ථා සම්පාදනයකිරීමට බලයලත් නියම නිලධාරීතැන විසින් එනම්, කළුතර නාගරික සභාවේ ප්‍රධානතුමා විසින් එකී නාගරික සභාව වෙනුවෙන් සම්පාදිත අතුරු ව්‍යවස්ථා.

සී. ඒ. කූරේ,
කළුතර නාගරික සභාවේ සභාපතිතැන.

1940 මැයි මස 17 වෙනි දින
කළුතර නාගරික සභා කාර්යාලයේදීය.

**අතුරු ව්‍යවස්ථා.**

1. මේ අතුරු ව්‍යවස්ථාවල—

"ප්‍රධානතුමා" යනුවෙන් කළුතර නාගරික සභාවේ ප්‍රධානතුමාද;

"අවුරුදු පතා ලියාපදිංචිකිරීමේ ගාස්තුව" යනුවෙන් ආඥාපනතේ 4 වැනි වගන්තිය යටතේ අයකළයුතු අවුරුදු පතා ලියාපදිංචිකිරීමේ ගාස්තුවද;

බල්ලකු සම්බන්ධයෙන් "අයිතිකාරයා" යනුවෙන් ඒ බල්ලා භාරව හෝ අයිතිකරගෙන හෝ සිටින අයද;

අදහස්කරනු ලැබේ.

2. (1) වයස 6 මසකට වැඩිවූ යම් බල්ලකු තබාගෙන සිටින ගෙයක හෝ ස්ථානයක පදිංචිකාරයා විසින් එක් එක් අවුරුද්දේ මාර්තු මස 1 වැනිද හෝ ඊට ප්‍රථමයෙන් ඒ බල්ලා කළුතර නාගරික සභාපතිතුමා වෙත මීට යාකොට ඇති උපලේඛනයේ තිබෙන පෝර්මයේ ප්‍රකාර වාර්තාවක් ඉදිරිපත් කළයුතුයි.

(2) යම් අවුරුද්දක මාර්තු මස 1 වැනිදයින් පසු යම් අයකු විසින් යම් ගෙයක හෝ ස්ථානයක බල්ලකු තබාගැනීමට පටන්ගත්විට ඒ ගෙයි හෝ ස්ථානයේ පදිංචිකාරයා විසින් ඒ බල්ලා නාගරිකසභාපතිතුමා වෙත මීට යාකොට ඇති උපලේඛනයේ තිබෙන පෝර්මයේ ප්‍රකාර වැඩිපුර වාර්තාවක් වහාම ඉදිරිපත් කළයුතුයි.

3. එක් එක් බල්ලාගේ අයිතිකාරයා විසින් අවුරුදුපතා ලියාපදිංචිකිරීමේ ගාස්තුව—

(a) 2 (1) වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ වාර්තාවක් සපයන ලද බල්ලකු සම්බන්ධයෙන් වූවිට ගාස්තුව අයවියයුතු අවුරුද්දේ අප්‍රේල් මස 1 වැනිද හෝ ඊට ප්‍රථමයෙන්; හෝ

(b) 2 (2) වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ වැඩිපුර වාර්තාවක් සපයනලද බල්ලකු සම්බන්ධයෙන් වූවිට ඒ වැඩිපුර වාර්තාව සපයන ලද දිනයෙහි සිට පසළොස් දිනක් ඇතුළතදීද;

ගෙවිය යුතුයි.

4. අවුරුදුපතා ලියාපදිංචිකිරීමේ ගාස්තුව ගෙවූවිට සභාපතිතුමා විසින් බල්ලා අයිතිකාරයාට—

(i.) ලියාපදිංචිකිරීමේ සහතිකපත්‍රයක්, හා

(ii.) සහතිකපත්‍රයේ අංකය ගසා ඇති පිත්තල තහඩුවක් හෝ කරපටියක්,

නිකුත්කළ යුතුයි.

එහෙත් සභාපතිතුමා විසින් ලියාපදිංචිකිරීම සඳහා ඉල්ලීමක් කළ ඕනෑම බල්ලකු රෙජිස්ටර් නොකිරීමට නියමකිරීමත්;

(a) ඒ බල්ලා රෙජිස්ටර් නොකිරීම්තේනම්; හෝ

(b) සභාපතිතුමාගේ කල්පනාවේ හැටියට ඒ බල්ලා ජීවත්ව සිටීමට නුසුදුසු ලෙස අධික වියපත්වූ හෝ රෝග සහිතවූ හෝ වෙනත් බල්ලන්ට බෝවිය හැකියේ යම් රෝගයකින් පෙළෙන්නාවූ සතෙක් වේනම්; හෝ

(c) අයිතිකාරයා විසින් ඒ බල්ලාව නිතරම සිරිතක් ලෙස හිංසාකරනු ලැබේනම් හැතහොත් ඌ නොසලකා හරිනු ලැබේ නම්;

ලියාපදිංචිකිරීමේ සහතිකපත්‍රයක් හා පිත්තල තහඩුවක් හෝ කරපටියක් ඒ බල්ලා වෙනුවෙන් නිකුත්කිරීම ප්‍රතික්ෂේප කිරීමත්; කළ හැකියි.

5. ලියාපදිංචිකිරීමේ සහතිකපත්‍රයක් නිකුත්කර තිබෙන යම් බල්ලකුගේ අයිතිකාරයාගේ පදිංචි ස්ථානයෙහි දුන්විමක් (නොතිසියක්) තිබෙන්නට හැර ආවාට පසු සභාපතිතුමා විසින් ඒ සහතිකපත්‍රය—

(a) සභාපතිතුමාගේ කල්පනාවේ හැටියට ඒ බල්ලා ජීවත්ව සිටීමට නුසුදුසු ලෙස අධික වියපත්ව හෝ රෝග සහිතව සිටීනම්; හෝ

(*b*) අයිතිකාරයා විසින් ඒ බල්ලාට සිරිතක් ලෙස නිතරම හිංසාකරනු ලැබේනම් නැතහොත් ඌ නොසලකා හරිනු ලැබේනම්; හෝ

(*c*) ඒ බල්ලා වාතයෙන් හෝ ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් පෙළෙමින් සිටියදී අයිතිකාරයා විසින් ඌට වෙනයම් බල්ලකු සමග එකට හැසිරීමට අවකාශ දෙනු ලැබේනම්; හෝ

(*d*) ඒ බල්ලා විකෑවී තහඩුවක් හෝ කරපටියක් නැතුව ද්‍රධාවමින් යන බැව් දකින්නට ලැබේනම්;

අවලංගුකළ හැකිසි.

6. (1) 4 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ලියාපදිංචිකිරීමේ සහතිකපත්‍රයක් දීම ප්‍රතික්ෂෙපකර ඇත්තාවූ හෝ 5 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඒ සහතිකපත්‍රය අවලංගුකර ඇත්තාවූ හෝ යම් බල්ලකුගේ අයිතිකාරයා විසින් තමාට ඒ සම්බන්ධයෙන් සභාපතිතුමා විසින් දැන්වීමක් (නොතීසියක්) භාරකරවූවිට ඒ දැන්වීමෙහි සඳහන්වන්නාවූ වේලාවේදීත් ස්ථානයේදීත් ඒ බල්ලා ගෙනවුත් පෙන්නාසිටිය යුතුයි.

(2) සභාපතිතුමාට සුදුසුයයි කල්පනාවනහැටියකින් එවැනි සෑම බල්ලකුම විනාශකිරීම හෝ ඌට වෙනයම් සුදුස්සක් හෝ කළ හැකිසි.

7. විකෑවී තහඩුවක් හෝ කරපටියක් නිකුත්කර ඇති කවර බල්ලකුගේ වුවත් අයිතිකාරයා විසින්, ඒ බල්ලා සම්බන්ධයෙන් නිකුත්කරනලද ලියාපදිංචිකිරීමේ සහතිකපත්‍රය වලංගුව පවත්නා කාලයඅළ සෑම විටෙකම ඒ බල්ලාගේ කරේ ඒ විකෑවී තහඩුව හෝ කරපටිය හොඳින් සවිකොට තිබෙන බැව් දැක්මට, වුවමනා සෑම අන්දමින්ම ක්‍රියාකළ යුතුයි.

8. මේ අතුරු ව්‍යවස්ථාවලින් සභාපතිතුමා කෙරෙහි පවරනලද බලවලින් කිසිවක් හෝ සියල්ලම පාවිච්චිකිරීමට සභාපතිතුමා විසින් යම් අයකුට ලියවිල්ලකින් බලය පැවරිය හැකිසි.

9. අංක 7,744 දරණ 1929 නොවැම්බර් මස 8 වැනි දින දරන ගැසට් පත්‍රයෙන් පළවූ බල්ලන් ලියාපදිංචිකිරීම පිළිබඳවූ අතුරු ව්‍යවස්ථා මෙයින් අවලංගුකරනු ලැබේ.

උප ලේඛනය.

පෝරමය.

| | |
|---|---|
| අංකය : ——. | අංකය : ——. |
| ගෙයි අංකය : ———. | 19—. මාර්තු මස 1 වැනිදා හෝ ඊට ප්‍රථමයෙන් සම්පූර්ණකොට පොලිස් විදානේ වෙත ආපසු යැවියයුතු වාර්තාවයි. |
| වීදිය : ———. | ගෙයි අංකය : ———. |
| ගමේ නම : ———. | වීදියේ අංකය : ———. |
| වත්තේ නම : ———. | ගමේ නම : ———. |
| ගෘහමූලිකයාගේ නම : ———. | වත්තේ නම : ———. |
| | ගෘහමූලිකයාගේ නම : ———. |

| තබාගෙන සිටින බල්ලන්ගේ ගණන | විස්තරය: වර්ගය | ගැහැණු සතාද පිරිමි සතාද | පාට | බෙල්ලේ මහත | වෙනස් ලකුණු | වෙනත් කරුණු | අයිතිකාරයාගේ නම | ලබන අප්‍රේල් මස 1 වැනිදා හෝ ඊට ප්‍රථමයෙන් ගෙවීමේ දිනය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |

භාරදුන් දිනය : 19——.

භාරදුන් දිනය : 19——.

——————,
ගෘහමූලිකයාගේ අත්සන.

——————,
භාරදෙන අයගේ අත්සන.

නියමිත දිනදී හෝ ඊට ප්‍රථමයෙන් මේ වාර්තාව සම්පූර්ණකොට ආපසු නොයැවීම ගැන දඩුවමක් වශයෙන් රුපියල් 20කට වැඩිනැති දඩයක් ගැසිය හැකිසි.

M. L. A.—B 1003
L. D.—B 25/40

## බල්ලන් ලියාපදිංචිකිරීමේ ආඥාපනත.

කළුතර දිස්ත්‍රික්කයේ හොරණ, වාද්දුව, අළුත්ගම, ගෙතුඹුවන, දොඩංගොඩ, අගලවත්ත යන සෞඛ්‍යරක්ෂක සභා (සනීප) නගරවලට බල්ලන් ලියාපදිංචිකිරීමේ ආඥාපනතේ (334 වැනි පරිච්ඡේදය) 4 වැනි වගන්තිය යටතේ අතුරු ව්‍යවස්ථා සම්පාදනයකිරීමට බලයලත් නියම නිලධාරීතැන විසින් එනම්, කළුතර දිස්ත්‍රික්කයේ සෞඛ්‍යරක්ෂක සභාවේ ප්‍රධානතුමා විසින් එකී දිස්ත්‍රික්කයේ එකී සෞඛ්‍යරක්ෂක සභා නගර වෙනුවෙන් සම්පාදිත අතුරු ව්‍යවස්ථා.

එච්. ඒ. තෙන්නකෝන්,
ප්‍රධානතැන.

1940 මැයි මස 15වෙනි දින
කළුතර සෞඛ්‍යරක්ෂක සභා කාර්යාලයේදීය.

### අතුරු ව්‍යවස්ථා.

1. මේ අතුරු ව්‍යවස්ථාවල—

"ප්‍රධානතුමා" යනුවෙන් කළුතර දිස්ත්‍රික්කයේ සෞඛ්‍යරක්ෂක සභාවේ ප්‍රධානතුමාද;

"අවුරුදුපතා ලියාපදිංචිකිරීමේ ගාස්තුව" යනුවෙන් ආඥාපනතේ 4 වැනි වගන්තිය යටතේ අයකළයුතු අවුරුදුපතා ලියාපදිංචිකිරීමේ ගාස්තුවද;

බල්ලකු සම්බන්ධයෙන් "අයිතිකාරයා" යනුවෙන් ඒ බල්ලා භාරව හෝ අයිතිකරගෙන හෝ සිටින අයද;

අදහස්කරනු ලැබේ.

2. (1) වයස 6 මසකට වැඩිවූ යම් බල්ලකු තබාගෙන සිටින ගෙයක හෝ ස්ථානයක පදිංචිකාරයා විසින් එක් එක් අවුරුද්දේ මාර්තු මස 1 වැනිදා හෝ ඊට ප්‍රථමයෙන් ඒ බල්ලා තබාගෙන සිටින කොට්ඨාසයේ පොලිස් විදානේ වෙත මීට යාකොට ඇති උප ලේඛනයේ තිබෙන පෝරමයේ ප්‍රකාර වාර්තාවක් සැපයිය යුතුයි.

(2) යම් අවුරුද්දක මාර්තු මස 1 වැනිදසින් පසු යම් අයකු විසින් යම් ගෙයක හෝ ස්ථානයක බල්ලකු තබාගැනීමට පටන්ගත්විට ඒ ගෙයි හෝ ස්ථානයේ පදිංචිකාරයා විසින් ඒ බල්ලා තබාගත් කොට්ඨාසයේ පොලිස් විදානේ වෙත මීට යාකොට ඇති උප ලේඛනයේ තිබෙන පෝර්මයේ ප්‍රකාර වැඩිපුර වාර්තාවක් වහාම සැපයිය යුතුයි.

3. එක් එක් බල්ලාගේ අයිතිකාරයා විසින් අවුරුදුපතා ලියාපදිංචිකිරීමේ ගාස්තුව—

(*a*) 2 (1) වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ වාර්තාවක් සපයනලද බල්ලකු සම්බන්ධයෙන්වූවිට ගාස්තුව අයවියයුතු අවුරුද්දේ අප්‍රේල් මස 1 වැනිදා හෝ ඊට ප්‍රථමයෙන්; හෝ

(*b*) 2 (2) වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ වැඩිපුර වාර්තාවක් සපයනලද බල්ලකු සම්බන්ධයෙන් වූවිට ඒ වැඩිපුර වාර්තාව සපයනලද දිනයෙහි සිට පසළොස් දිනක් ඇතුලතදීද;

ගෙවිය යුතුයි.

4. අවුරුදුපතා ලියාපදිංචිකිරීමේ ගාස්තුව ගෙවූවිට ප්‍රධානතුමා විසින් බල්ලා අයිතිකාරයාට—

(i.) ලියාපදිංචිකිරීමේ සහතිකපත්‍රයක්, සහ

(ii.) සහතිකපත්‍රයේ අංකය සහ ඇති විකෑවී තහඩුවක් හෝ කරපටියක්,

නිකුත්කළ යුතුයි.

එසේ ප්‍රධානතුමා විසින්, ලියාපදිංචිකිරීම සඳහා ඉල්ලීමක් කළ ඕනෑම බල්ලකු පෙන්නාසිටීමට නියමකිරීමත්,

(*a*) ඒ බල්ලා පෙන්නා නොසිටින්නේ නම්; හෝ

(*b*) ප්‍රධානතුමාගේ කල්පනාවේ හැටියට ඒ බල්ලා ජීවත්ව සිටීමට නුසුදුසු ලෙස අබගවිකාලවූ හෝ රෝග සහිතවූ හෝ වෙනත් බල්ලන්ට බෝවිය හැකිසේ යම් රෝගයකින් පෙළෙන්නාවූ සතෙක් වේනම්; හෝ

(*c*) අයිතිකාරයා විසින් ඒ බල්ලාට නිතරම සිරිතක් ලෙස හිංසාකරනු ලැබේනම් නැතහොත් ඌ නොසලකා හරිනු ලැබේ නම්;

ලියාපදිංචිකිරීමේ සහතිකපත්‍රයක් සහ විකෑවී තහඩුවක් හෝ කරපටියක් ඒ බල්ලා වෙනුවෙන් නිකුත්කිරීම ප්‍රතික්ෂෙප කිරීමක්, කළහැකිසි.

5. ලියාපදිංචිකිරීමේ සහතිකපත්‍රයක් නිකුත්කර තිබෙන යම් බල්ලකුගේ අයිතිකාරයාගේ පදිංචි ස්ථානයෙහි දැන්වීමක් (නොතීසියක්) තිබෙන්නට හැර ආවාට පසු ප්‍රධානතුමා විසින් ඒ සහතිකපත්‍රය—

(*a*) ප්‍රධානතුමාගේ කල්පනාවේ හැටියට ඒ බල්ලා ජීවත්ව සිටීමට නුසුදුසු ලෙස අබගවිකාලව හෝ රෝග සහිතව සිටීනම්; හෝ

(*b*) අයිතිකාරයා විසින් ඒ බල්ලාට සිරිතක් ලෙස නිතරම හිංසාකරනු ලැබේනම් නැතහොත් ඌ නොසලකා හරිනු ලැබේනම්; හෝ

(*c*) ඒ බල්ලා වාතයෙන් හෝ ස්පර්ශයෙන් බෝවන රෝගයකින් පෙළෙමින් සිටියදී අයිතිකාරයා විසින් ඌට වෙනයම් බල්ලකු සමග එකට හැසිරීමට අවකාශ දෙනු ලැබේ නම්; හෝ

(*d*) ඒ බල්ලා විකෑවී තහඩුවක් හෝ කරපටියක් නැතුව ද්‍රධාවමින් යන බැව් දකින්නට ලැබේනම්;

අවලංගුකළ හැකිසි.

6. (1) 4 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ලියාපදිංචිකිරීමේ සහතිකපත්‍රයක් දීම ප්‍රතික්ෂෙපකර ඇත්තාවූ හෝ 5 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඒ සහතිකපත්‍රය අවලංගුකර ඇත්තාවූ හෝ යම් බල්ලකුගේ අයිතිකාරයා විසින් තමාට ඒ සම්බන්ධයෙන් ප්‍රධානතුමා විසින් දැන්වීමක් (නොතීසියක්) භාරකරවූවිට ඒ දැන්වීමෙහි සඳහන්වන්නාවූ වේලාවේදීත් ස්ථානයේදීත් ඒ බල්ලා ගෙනවුත් පෙන්නාසිටිය යුතුයි.

(2) ප්‍රධානතුමාට සුදුසුයයි කල්පනාවන හැටියකින් එවැනි සෑම බල්ලකුම විනාශකිරීම හෝ උගුවවෙනයම් සුදුස්සක් හෝ කළහැකිසි.

7. වසැව් තහඩුවක් හෝ කරපටියක් නිකුත්කර ඇති කවර බල්ලකුගේ වුවත් අයිතිකාරයා විසින් ඒ බල්ලා සම්බන්ධයෙන් නිකුත්කරනලද ලියාපදිංචිකිරීමේ සහතිකපත්‍රය වලංගුව පවතිනා කාලයතුළ සෑම විටෙකම ඒ බල්ලාගේ කරේ ඒ වසැව් තහඩුව හෝ කරපටිය හොඳින් සවිකොට තිබෙන බැව් දක්මට වුවමනා සෑම අංශමින්ම ක්‍රියාකළ යුතුයි.

8. මේ අතුරු ව්‍යවස්ථාවලින් ප්‍රධානතුමා කෙරෙහි පවරන ලද බලවලින් කිසිවක් හෝ සියල්ලම පාවිච්චිකිරීමට ප්‍රධානතුමා විසින් යම් අයකුට ලියවිල්ලකින් බලය පැවරිය හැකිසි.

9. අංක 8,028 හා 1934 ජනවාරි මස 19 වැනි දින දරණ ගැසට් පත්‍රයේ පළවූ බල්ලන් ලියාපදිංචිකිරීම පිළිබඳවූ අතුරු ව්‍යවස්ථා මෙයින් අවලංගුකරනු ලැබේ.

## උප ලේඛනය.

පෝරමය.

අංකය :——.
ගෙයි අංකය :————.
වීදිය :————.
ගමේ නම :————.
වත්තේ නම :————.
ගෘහමූලිකයාගේ නම :————.

අංකය :——.
19—මාර්තු මස 1 වෙනිදා හෝ ඊට ප්‍රථමයෙන් සම්පූර්ණකොට පොලිස් විදානේ වෙත ආපසු යැවිය යුතු වාර්තාවයි.
ගෙයි අංකය :————.
වීදියේ අංකය :————.
ගමේ නම :————.
වත්තේ නම :————.
ගෘහමූලිකයාගේ නම :————.

| නිවාසෙහි සිටින අයගේ නම | විස්තරය | | | | වෙනත් කරුණු | අයිතිකාරයාගේ නම | ලබන අප්‍රේල් මස 1 වැනිදා හෝ ඊට ප්‍රථමයෙන් ගෙවීමේ දිනය |
|---|---|---|---|---|---|---|---|
| | වයස | ස්ත්‍රී පුරුෂ භාවය | ජාතිය | ගෙදර පදිංචි කාලය | | | |
| | | | | | | | |

භාරදුන් දිනය : 19——.

භාරදුන් දිනය : 19——.

————
ගෘහමූලිකයාගේ අත්සන.

————,
භාරදෙන අයගේ අත්සන.

නියමිත දිනදී හෝ ඊට ප්‍රථමයෙන් මේ වාර්තාව සම්පූර්ණකොට ආපසු නොයැවීම ගැන අධිවමක් වශයෙන් රුපියල් 20කට වැඩි නැති දඩයක් ගැසිය හැකියි.

## ඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම.

### ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතයි.

### නිරවුල්කිරීමේ දැන්වීම් නො. 2,186 (කොළඹ).

මීට යාකර තිබෙන උප ලේඛනයෙහි විස්තරවෙන ඉඩම්වලින් කිසිවක් හෝ ඒ ඉඩම්වල කිසියම් කොටසක් හෝ ගොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය මේ 1940ක්වූ මැයි මස 24වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත අත්සන්කරණ මා වෙත ඉදිරිපත් නොකළොත් එකී ඉඩම රජසන්තක ඉඩමයැයි ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතේ 5 (1) වන වගන්තිය යටතේ ප්‍රකාශකරනලබන බවද රජසන්තක ඉඩමක් වශයෙන් ගෙන ඒව කවයුතුකරණ බවද එකී ආඥාපණතේ 4වන වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

මේ 1940ක්වූ අප්‍රේල් මස 16වෙනි දින කොළඹ කච්චේරියේදීය.

ආර්. ඇස්. බී. පෙරේරා,
කොළඹ දිස්ත්‍රික්කේ ආණ්ඩුවේ අතිරේක
උප ඒජන්තතුමා වෙනුව.

(a) මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු බස්නාහිර දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

(b) මෙසී ඉඩම්වලට හෝගොත් එයින් එකකටවත් උඩින් යන යම් පාරකට අයිතිකම්කීම, ඒ ඉඩමට හෝගොත් ඉඩම්වලට අයිතිකම්කීම හැටියට බාරගනු ලැබේ.

## උප ලේඛනය.

බස්නාහිර දිසාවේ කොළඹ දිස්ත්‍රික්කයේ හාපිටිගම්කෝරළේ උඩුගහපත්තුවේ බෝතලේ ඉහලගම පිහිටා තිබෙන පහත සඳහන් බිම්කට්ටි.

### I.—කැලෑම්නිමේ මුල් සිතියම නො. 64.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 30 | විලිකුලකන්ද (උතුඅැලදෙලදිගේ (අත්හැර තිබෙන බිම්කොටස) .. | 0 3 30 |

මීට මායිම්—උතුරට නො. 182,294 දරන පිඹුරුකඩදසි පිට අයි. පූංචිහෝනා සහ තවත් අය උරුම්කියන ඉඩමද; නැගෙනහිරට උතුදෙලඇලද; දකුනට මෙම සිතියමේ නො. 31 දරන විලිකුලකන්දකියන ඉඩමද; බස්නාහිරට නො. 262,002 දරණ පිඹුර පිට ජී. ඒබ්‍රහම් අප්පුහාමි අයිතිකම් කියන බරන්දෙරේහේන සහ නො. 13,545 මුල් සිතියමේ නො. 23,017 දරන විලිකුලකන්දේ කැලේද වේ.

### II.—කැලෑම්නිමේ මුල් සිතියම නො. 64.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 29 | විලිකුලකන්ද අඩිපාරට අත්හැරපු ඉඩම .. | 0 0 23 |
| 31 | එම .. | 137 0 10 |
| 37 | එම උතුදෙලඇලට අත්හැරපු ඉඩම .. | 0 1 0 |
| | | 137 1 33 |

මීට මායිම්—උතුරට නො. 184,649 දරණ පිඹුරපිට අයි. පීරිස් අයිතිකම්කියන බඩලුම්පිටිය. නො. 20,207 මුල් සිතියමේ නො. 2 දරන කජුගහහේන, ඉම්යාරලලාගේ පූංචිහෝනා විසින් නො. 23,223 පිඹුරුකඩදසිය පිට අයිතිකම්කියන එම සිතියමේ නො. 3 දරන කජුගහවත්ත, බෝදිපක්ෂකරුනා වල්ලබ නානායක්කාර නො. 22,945 පිඹුරුකඩදසිය පිට අයිතිකම්කියන එම සිතියමේ නො. 4 දරන විලිකුලකන්ද හෝගොත් කජුගහහේන, බෝදිපක්ෂකරුනාවල්ලබ පීටර අප්පුහාමි සහ තවත් අය නො. 129,938 දරන පිඹුරුකඩදසිය පිට අයිතිකම්කියන කජුගහහේන, නො. A 141 මුල් සිතියමේ නො. 2 දරන බඩලුම්පිටියවත්ත, ඩබ්ලිව්. අයි. පීරිස් නො. T 17,672 දරන පිඹුර පිට අයිතිකම්කියන එම සිතියමේ නො. 1 දරන බඩලුම්පිටියවත්ත, මෙම සිතියමේ නො. 27 දරන විලිකුලකන්ද සහ බෝතලේ ඉහලගම සිට බලගොඩට යන අඩිපාර; නැගෙනහිරට බෝතලේ ඉහලගම සිට බලගොඩට යන අඩිපාර, අත්නාගලඇල සහ සබරගමු දිසාවේ මායිම; දකුනට සබරගමු දිසාවේ මායිම, ඇම්. සිංචියා සහ පී. ඒ. ජෝසප් අප්පුහාමි නො. 170,431, 254,147 දරණ පිඹුරුකඩදසි පිට අයිතිකම්කියන කොස්හින්නේවත්ත, මෙම සිතියමේ නො. 34 දරන කොස්හින්නේවත්ත, නො. 33 දරන තැන්නෙහේනේවත්ත, බෝතලේ ඉහලගම පදිංචි බෝදිපක්ෂ ජේම්ස් අප්පුහාමි සහ බෝදිපක්ෂ ධම්දස නො. T 22,669 දරන පිඹුරුකඩදසි පිට අයිතිකම්කියන මෙම සිතියමේ නො. 32 දරන තැන්නෙහේනේවත්ත, උතුදෙල ඇල, බී. ජේම්ස් අප්පුහාමි බී. පීටර් අප්පුහාමි සහ පී. ඒ. අර්නොලිස් අප්පුහාමි නො. 129,957 දරණ පිඹුරුකඩදසි පිට අයිතිකම්කියන කොස්හින්නේදෙනිය බී. ජේම්ස් අප්පුහාමි නො. T 22,706 පිඹුරුකඩදසිය පිට අයිතිකම්කියන මෙම සිතියමේ නො. 38 දරන තැන්නෙහේනේවත්ත හෝගොත් විලිකුලකන්දවත්ත, නො. 39 දරන විලිකුලකන්ද බෝතලේ ඉහලගම සිට වරකාපොලට යන පාර; බස්නාහිරට බෝතලේ ඉහලගම සිට වරකාපොලට යන පාර ජී. ඒබ්‍රහම් අප්පුහාමි නො. 262,002 දරණ පිඹුරුකඩදසිය පිට අයිතිකම්කියන බරන්දෙරේහේන වන මෙම සිතියමේ නො. 30 දරන විලිකුල කන්ද, උතුදෙලඇල සහ පී. ඒ. ජෝසප් අප්පුහාමි නො. 182,294 දරන පිඹුරුකඩදසිය පිට අයිතිකම්කියන පොල්ගහ හේන.

### III.—කැලෑම්නිමේ මුල් සිතියම නො. 64.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 42 | බරන්දෙරේවත්ත .. .. | 2 0 16 |

මීට මායිම්—උතුරට මෙම සිතියමේ නො. 46 දරන විලිකුල කන්ද, නො. 43 දරන පොල්ගහහේනේවත්ත; නැගෙනහිරට ජී. ඒබ්‍රහම් අප්පුහාමි නො. 262,002 දරන පිඹුරුකඩදසිය පිට අයිතිකම්කියන බරන්දෙරේහේන, නො. 13,545 මුල් සිතියමේ නො. 23,017 දරන පාරව වෙන්කරපු ඉඩම සහ මෙම සිතියමේ නො. 46 දරන විලිකුලකන්ද; දකුනට සහ බස්නාහිරට මෙම සිතියමේ නො. 46 දරන විලිකුලකන්ද.

## ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම.

Matale No. 86.—මාතලේ දිසාවේ උප ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1940ක්වූ ජූලි මස 16වෙනි දිනවූ අඟහරුවාදා පස්වරු 2.30ට මඩවල පාඨශාලාවේදී වෙන්දේසිකර විකුණන්ට යෙදෙනවා ඇත. මාතලේ දිසාවේ මාතලේ දකුණු පලාතේ තිබෙන බිම්කැබලි හයක්.

අවසාන සිතියමේ නො. 26. ගම—හතමුණගල.

| නො. | ඉඩමේ නම. | අයිතිකම්කියන්නෝ. | අන්දම. | මනින, අ. රූ. ප. | | | අක්කරයක වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 27J5 | ඇවරියගලමුලහේන හෝ හොත් ඉඹිලමුලහේන | ආණ්ඩුව සහ හතමුණගල ඇම්. ඇස්. අයියාදෙරේ | අලුතෙන් එළිකරපු වතු ඉඩම | 0 | 0 | 16·2 | 50 |
| 27J6 | එම .. | එම .. .. | එම .. | 0 | 0 | 35 | 40 |
| | | අවසාන සිතියමේ නො. 24. ගම—නාරන්ගොමුව. | | | | | |
| 80AC | බිත්තැන්නේකුඹුර .. | ආණ්ඩුව සහ නාරන්ගමුවේ බණ්ඩාක් මුදියන්සෙලැ හිංගිරාල සහ අප්පුහාමි | අලුත අස්වැද්දපුකුඹුර .. | 0 | 0 | 15 | 60 |
| 81B | එම .. | ආණ්ඩුව සහ බණ්ඩාක් මුදියාන්සේලැ හිංගිරාල සහ අප්පුහාමිද, තලගස් යාගේ ඇම්. පී. රත්නායක | එම .. | 0 | 0 | 2 | 60 |
| 81C | එම .. | ආණ්ඩුව සහ නාරන්ගොමුවේ බණ්ඩාක් මුදියන්සේලැ හිංගිරාල සහ අප්පුහාමි | එම .. | 0 | 0 | 4 | 60 |
| 74½ | හාමගෙඋල්පොත .. | ආණ්ඩුව සහ ඇහැළපොලවත්ත වෙනුවෙන් මෙල්ඩන් වතු කොම් පැනිය | අලුත එළිකරපු වතුඉඩම | 0 | 0 | 3 | 60 |

මෙම ඉඩම් ගැන වැඩිදුර කාරණා මාතලේ උප ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගන්ට පුළුවන.

වර්ෂ 1940ක්වූ මැයි මස 18වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ විසින්.

---

Matale No. 87.—මාතලේ දිසාවේ උප ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1940ක්වූ ජූලි මස 17වෙනි දිනවූ බදාදා පස්වරු 2.30ට දඹුල්ලේ ගම්සභා උසාවියේදී වෙන්දේසිකර විකුණන්ට යෙදෙනවා ඇත. මාතලේ දිසාවේ මාතලේ උතුරු පලාතේ ලේනදෙර ගමේ පිහිටා තිබෙන බිම්කැබලි 1ක්.

මුල් සිතියමේ නො. 8,902. ගම—ලේනදෙර.

| නො. | ඉඩමේ නම. | අයිතිකම්කියන්නෝ. | අන්දම. | මනින, අ. රූ. ප. | | | අක්කරයක වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 7 | ඉහලතඹුම්රිය .. | හේරත්මුදියන්සෙලාගේ ඉහළගෙදර හිංගිරිමැණිකා, හේරත්මුදියන්සෙලාගේ ඉහළගෙදර ලොකුබණ්ඩා, හේරත්මුදියන්සෙලාගේ ඉහළගෙදර අප්පුහාමි, හේරත්මුදියන්සෙලාගේ බණ්ඩාරමැණිකා | කැලේ .. | 4 | 2 | 12 | 10 |

මෙම ඉඩම ගැන වැඩිදුර කාරණා මාතලේ උප ඒජන්ත උන්නාන්සේගෙන්ද, එහි සිතියම සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගන්ට පුළුවන.

වර්ෂ 1940ක්වූ මැයි මස 18වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ විසින්.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්බර් 3 වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කාර්‍යයක් සඳහා, ඒනම්:—වාද්දුවේ ප්‍රසූතිකාගාරයක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස “ වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ ” හයවෙනි කාණ්ඩයේ සරහිබෙන පංගාර්ථවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේ කෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම් නම්:—

සිතියමේ නො. A 1,130. ගම—මහවාද්දුව (බස්නාහිර.)

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකම්කියන්නෝ. | මනින, අ. රූ. ප. | | |
|---|---|---|---|---|---|---|
| 2 | කොස්ගහලන්දෙවත්ත, වරී පනම් නො. 348 සහ 350 (190)හේ කොටස් | අවුරුදු 30ක පොල්ගස් 27ක් සහ අවුරුදු 30ක දෙල්ගස් 2ක් ඇති පොල්ඉඩමක් | මැස්තියගේ දොන් අන්දිරිස් ගුණතිලක, දකුණු කල්පවිය, වාද්දුව | 0 | 1 | 15 |
| 2 | එම .. | අවුරුදු 30ක පොල්ගස් 2ක් ඇති පොල් ඉඩමක් | එම .. | 0 | 0 | 2·8 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දන්වම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරන අය වර්ෂ 1940ක්වූ ජූනි මස 15වෙනි දින පෙරවරු 10යේ කාලයමට කළුතර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1940ක්වූ මැයි මස 17වෙනි දින කළුතර කච්චේරියේදීය.

එච්. ඊ. ගුණනායක්,
කළුතර ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත විසින්.

---

## ටෙන්ඩර්ස් නම් ඉල්ලුම්පත්‍ර පිළිබඳ දැන්වීම.

L. H. 1743.

නො. 15,805 දරණ මුල් සිතියමේ නො. 6486, 6487 සහ 6488 යන අංකවලින් යුත් මෝදර පිහිටි බිම්කැබලිය සම්බන්ධවයි.

මෙහි පහත දක්වන උප ලේඛනයේ සඳහන්කරණ ඉඩම පලවැට සහ තණ වැවීමට වර්ෂ 1940ක්වූ ජූලි මස 1වෙනි දින පටන් පස් (5) අවුරුදු තුන්මාසයක බද්දට මෙහි පහත සඳහන් කොන්දේසිවලට යටත්ව මිලට ගැනීම පිණිස එවනු ලබන සීල් තබනලද ඉල්ලුම්පත්‍ර බස්නාහිර පළාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් භාරගන්ට යෙදෙන බව මෙයින් දන්වම්දෙනු ලැබේ.

සංවෘත්ත ඉල්ලුම්පත්‍ර වර්ෂ 1940ක්වූ ජූනි මස 21වෙනි දිනවූ සිකුරාදා දවල් 11 වනතුරු භාරගෙන එදින එකී වේලාවට කඩාබලනු ඇත. ඉල්ලුම්පත්‍ර බහා එවනලද කවරවල පිට “ නො. 15,805 දරණ මුල් සිතියමේ නො. 6486, 6487 සහ 6488 යන අංකවලින් යුත් මෝදර පිහිටි බිම්කැබලියේ පලවැට සහ තණ වැවීමේ බද්ද ” කියා සඳහන්කළ යුතුයි. ඉල්ලුම්පත්‍ර

සැබෑබව ඔප්පුකිරීම පිණිස ඉල්ලුම්කරන්නාවූ සියළු දෙනාම තම තමන් හෝ තමන් වෙනුවට ක්‍රියාකරන්නෙක් ඒජන්ත උන්නාන්සේ ඉදිරියේ පෙනීසිටින්ට ඕනෑය.

වැඩි විස්තර කොළඹ කච්චේරියෙන් ඉල්ලුම්කොට ලබාගතහැක.

අත්තන්කලේ, ඩබ්ලිව්. ඕ. ස්ටීවන්ස්,
බස්නාහිර පලාතේ ආණ්ඩුවේ ඒජන්ත
උන්නාන්සේ.

1940ක්වූ මැයි මස 16වෙනි දින
කොළඹ කච්චේරියේදිය.

කොන්දේසි.

1. අටමාසයකට වැටහෙන බදු මුදල බද්දගත් අය විසින් ඇපයක් වශයෙන් බද්ද මිළයටගත් දින ගෙවිය යුතුය. මේ බද්ද සම්බන්ධ වෙනත් අයකිරීමක් ආණ්ඩුවට නොමැතිනම් මේ බදු මුදල බදු කාලයේ අවසාන අටමාසයේ බදු මුදල් වශයෙන් ගණන්ගනු ලැබේ. බදු මුදල් කාර්තුවක් පාසා (තුන්මාසයකට වරක්) කාර්තුව මුලදී ගෙවිය යුතුය.

2. බද්ද ගැනුම්කාරයා එකඟවියයුතු පොරොන්දු මෙසේය:—

(a) දිසාපතිතුමා විසින් දුන්වූ කඩිනමින් බදුඔප්පුව අත්සන් කිරීමත්,
(b) ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන් ලියවිල්ලකින් ලබාගත් අවසරයක් නොමැතිව තණකැවීමට හා එලවළු සහ තණ වැවීමට හැර මේ ඉඩම වෙනයම් කිසිම ප්‍රයෝජනයකට නොයොදන්වද,
(c) කිසිම අගලක්, ගහක් නොකපන්වද, මායිම් ගලක් වැටක් හෝ මායිමක් වෙනස් නොකරන්වද,
(d) ඉඩමෙන් වැලි බොරළු ආදිය නොගන්වද,
(e) ඉඩමේ වැටක් බඳින්ට කියා ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ අණකළොත් එසේ කරන්වද,
(f) ස්ථිර හෝ තාවකාලික ගොඩනැගිලිද, වෙළඳපොළ වල්ද නොකරන්වද,
(g) ඉඩම ශුද්ධපවිත්‍රලෙස තබාගන්ටත්, සියලුම අසබඩු ගෙවන්ටත්, නාගරික සභාවේ අණපනත් පරිදි ක්‍රියාකරන්ට නීතිවිරෝදී කටයුතු කෙරුනුවිටක පැමිණෙන නඩු දඩ ආදියට වගකීමෙන් ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ නිදහස්කරන්නටද,
(h) ඒජන්ත උන්නාන්සේගේ කැමැත්ත සහිත ලියවිල්ලක් නැතුව අන්කෙනෙකුට බද්ද පැවරීම හෝ විකිණීම නොකරන්වද,
(i) කිරිදෙනුන් (එළ හෝ මී) තණකැවීමට ඉඩනොදෙන්වද,
(j) මෙය වැලැක්වීම පිණිස නාගරික සභාවේ නිලධාරින්ගේ පරීක්‍ෂණයට ඉඩදෙන්වද;
(k) ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේට හෝ ඒ වෙනුවෙන් ක්‍රියාකරන්නෙකුට එම කාලය ඇතුළ සුදුසු වේලාවලදී ඉඩමේ තත්වය පරීක්‍ෂාකර බැලීම සඳහා ඉඩමට ඇතුල්වීමට ඉඩදෙන්වද,
(l) සම්පූර්ණ ඉඩම හෝ ඉන් කොටසක් බද්ද අවසානවෙන්ට පළමු ආණ්ඩුවට ඕනෑකළොත් මාසයක් කල්දුන්විට ආණ්ඩුවට භාරදෙන්වද එසේවූවිට බද්දෙන් ඉදිරියට කෙවන්ට තිබෙන කාලයට වැටහෙන මුදලක් ආපසු ලබාගෙන අස්වෙන්වද,
(m) ඉහත සඳහන් කොන්දේසි කඩකලොත් කිසිම මුදලක් නොගෙවා බදු ගැනුම්කාරයා හෝ ඔහුගේ වැඩකරුවන් ඉඩමෙන් අස්කර නැවත හැක්තිස භාර ගැනීමට සහ ඇපමුදල රජසන්තක කිරීමටත් ඒජන්ත උන්නාන්සේට හෝ ඒ වෙනුවෙන් ක්‍රියාකරන්නෙකුට ඉඩදෙන්වද යනුයි.

3 යම්කිසි ඉල්ලුම්පත්‍රයක් හෝ සියළුම ඉල්ළීම්පත්‍ර ප්‍රතික්‍ෂෙපකිරීමට ඒජන්ත උන්නාන්සේට බලය තිබේ.

උප ලේඛනය.

නො. 15,805 දරණ මුල් සිතියමේ ලොට්. 6486, 6487 සහ 6488 යන අංකවලින් යුත් කැළණිගඟේ මෝය අසල ඔමඩීන් වැඩුනු නො. 15,805 දරණ මුල් සිතියමේ Z 54 සහ A 55 යන අංකවලින් යුත් කාත්කාදූව නමින් ව්‍යවහාර කොටස හැර ඉතිරි ඉඩම.

පිහිටීම.—මෝදර.

බිම්ප්‍රමාණය.—අක්කර 17කුත් පර්චස් 5ක වැඩි අඩු ප්‍රමාණය.

ඉඩමේ විස්තර.—තණකොළ ඇති හිස් බිම.

අන්‍ය දැන්වීම.

වර්ෂ 1907 නොම්බර 1 වෙනි ආඥාපනතේ ප්‍රකාර යාපනේ කරම්පන් සැසිලිස්ති පදිංචි පොන්නම්පලම් රම්ලින්ගම් වන මම ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු හැටියට පත්වීමට බලාපොරොත්තුවන බැව් මෙයින් දැනුම්දෙමි.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.